සියලු ම හිමිකම් ඇවිරිණි

විශාඛා විද්‍යාලය, කොළඹ 5

පළමු වාර පරීක්ෂණය - 2016

බුද්ධ ධර්මය

කාලය : පැය 2 යි

7 ශ්‍රේණිය ..........

PAÑÑAYA PARISUJJHATI

නම / අංකය : ..........................................................................................

" ප්‍රශ්න සියල්ල හොඳින් කියවා පිළිතුරු සපයන්න.

## I කොටස

(01) වඩාත් සුදුසු පිළිතුර තෝරා පිළිතුරට යටින් ඉරක් අඳින්න.

(1) බුදුන් වහන්සේ විසින් තමන් වහන්සේ මෙන් වූ තවත් බුදුරුවක් මවාගනු ලැබුවේ බුද්ධත්වයෙන් පසුව ගත වූ,

(i) පළමු සතිය තුළදීය. (ii) තෙවන
(iii) පස්වන (iv) ඉහත කිසිඳු සතියක් තුළදී නොවේ

(2) අප මහ බෝසතාණන් වහන්සේ පස්වන සතිය ගත කරන ලද්දේ,

(i) මිදෙන්න ගස මුල (ii) අජපල් නුගරුක මුල
(iii) රුවන්ගෙයි (iv) මුචලින්ද නාග දරණ යට

(3) ප්‍රථම ද්වේවාචික උපාසකවරුන් සරණ ගියේ,

(i) බුද්ධ, ධම්ම හා සංඝ රත්නය (ii) බුද්ධ රත්නය හා සංඝ රත්නය
(iii) ධම්ම රත්නය හා සංඝ රත්නය (iv) බුද්ධ රත්නය හා ධම්ම රත්නය

(4) තෙරුවන් සරණ ගිය පළමු උපාසකයා වූයේ,

(i) තපස්සු භල්ලුක වෙළඳ දෙබෑයෝය. (ii) භද්ධවග්ගිය කුමාරවරුන්ය.
(iii) යසකුල පුත්‍රයාගේ පියාය. (iv) යසකුල පුත්‍රයාගේ මවය

(5) පෙස්වග මහණුන්ට ධර්මය දේශනා කළේ,

(i) උරුවෙල් දනව්වෙහි දීය. (ii) මගධ රාජ්‍යයෙහිදීය.
(iii) රජගහ නුවරදීය. (iv) බරණැස ඉසිපතනයේදීය.

(6) යසකුල පුත් පැවිදි වූ බව අසා පැමිණි ඔහුගේ මිතුරෙකි.

(i) සේනාධි (ii) භද්ධිය (iii) ගවම්පති (iv) කෝලි

(7) භගීරථ පරම්පරාවේ අය යනු,

(i) බ්‍රාහ්මණයෝය. (ii) කෝලිය වංශිකයෝය.
(iii) ශාක්‍ය වංශිකයෝය. (iv) කුලහීනයෝය.

(8) බුදුන් වහන්සේගේ ප්‍රථම කිඹුල්වත් නුවර ගමන ආරම්භ කරන ලද්දේ,

(i) මැදින් පුර පොහොය දිනදීය. (ii) වෙසක් පුර පොහොය දිනදීය.
(iii) පොසොන් පුර පොහොය දිනදීය. (iv) ඇසළ පුර පොහොය දිනදීය.

(9) ප්‍රථම රහත් සැට නමට අයත් නොවන රහතන් වහන්සේ වන්නේ,

(i) කොණ්ඩඤ්ඤ රහතන් වහන්සේය. (ii) වප්ප රහතන් වහන්සේය.

(iii) මුගලන් රහතන් වහන්සේය. (iv) යස රහතන් වහන්සේය.

(10) හිසෙහි ජටාවක් දරා සිටින්නන් හඳුන්වන්නේ,

(i) පරිබ්‍රාජක නමිනි (ii) ජටිල නමිනි

(iii) නිඝණ්ඨ නමිනි (iv) ආජීවක නමිනි

(11) ඕවාද ප්‍රාතිමෝක්ෂය යනු,

(i) වැරදිවලට දඬුවම් කිරීමය. (ii) වැරදිවලට දඬුවම් නොදී අවවාද කිරීමය.

(iii) කතා නොකර සිටීමය. (iv) වැරදි කළවුන්ට සමාව දීමය.

(12) බුදුන් වහන්සේගේ පිහිට ලැබූ අසරණ තිරශ්චීනයකු ලෙස නම් කරනුයේ,

(i) සෝපාකයි. (ii) භද්දවතිකාය

(iii) පටාචාරාවයි. (iv) කිසාගෝතමියයි.

(13) බුදුන් වහන්සේගේ අසම සම ගුණය හැඳින්වෙනුයේ,

(i) පුරිසධම්මසාරථී ගුණය ලෙසයි. (ii) බුද්ධො ගුණය ලෙසයි.

(iii) අනුත්තර ගුණය ලෙසයි. (iv) භාග්‍යවත් ගුණය ලෙසයි.

(14) "සිරිත්මල්දම" රචනා කරන ලද්දේ,

(i) තොටගමුවේ ශ්‍රී රාහුල හාමුදුරුවෝය.

(ii) වීදාගම මහා මෛත්‍රී හිමිපාණෝය.

(iii) අරිසෙන් අහුබුදු සූරීන්ය.

(iv) ඇම්.ඇල්. සිල්වා ගුරු මුහන්දිරම් තුමාය.

(15) බුදුරජාණන් වහන්සේ වනගතව භාවනා කළ භික්ෂූන් වහන්සේලාට වෘක්ෂ දේවතාවුන් වහන්සේලා කළ කරදරවලින් අත්මිදීම පිණිස දේශනා කළ සූත්‍රයකි,

(i) මංගල සූත්‍රය (ii) රතන සූත්‍රය

(iii) ධම්මචක්ක පවත්වන සූත්‍රය (iv) කරණීය මෙත්ත සූත්‍රය

(16) කරණීය මෙත්ත සූත්‍රයේ ඇතුළත් වන්නේ,

(i) බුද්ධරත්නයේ ගුණයයි. (ii) ධර්ම රත්නයේ ගුණයයි.

(iii) මෛත්‍රීයේ ගුණයයි. (iv) සංඝ රත්නයේ ගුණයයි.

(17) කරණීය මෙත්ත සූත්‍රය තුළ ඇතුළත් "සියලු සත්වයෝ" ඇතුළත් කර ඇති කොටස් සංඛ්‍යාව වන්නේ,

(i) 15 කි. (ii) 11 කි. (iii) 10 කි. (iv) 14 කි.

(18) මෛත්‍රී භාවනාවේ ආනිසංස ගණන,

(i) 10 කි. (ii) 11 කි. (iii) 15 කි. (iv) 9 කි.

(19) බුදු සසුනේ අග්‍ර දායකයා සහ දායිකාව වන්නේ,

(i) විශාඛා සිටු දියණිය හා අනේපිඬු සිටුතුමායි.

(ii) සුදත්ත සිටුතුමා හා විශාඛා සිටු දියණියයි.

(iii) අනේපිඬු සිටුතුමා හා විශාඛා විශාඛා සිටු දියණියයි.

(iv) විශාඛා සිටු දියණිය හා මිගාර සිටුතුමායි.

(20) ''අක්කොච්ඡි මං අවධි මං'' ගාථාවන් ඇතුළත් වන්නේ,

(i) ධම්ම පදයේ දණ්ඩ වග්ගයෙහි
(ii) ලොවැඩ සඟරාවෙහි යමක වග්ගයෙහි
(iii) ධම්ම පදයේ යමක වග්ගයෙහි
(iv) ලෝවැඩ සඟරාවෙහි දණ්ඩ වග්ගයෙහි

(02) A ප්‍රකාශන හා ගැළපෙන පිළිතුර තෝරා B ප්‍රකාශන තුළින් තෝරා යා කරන්න.

| A ප්‍රකාශන | B ප්‍රකාශන |
|---|---|
| 1. නිපක ගුණය යනු | a. සත්මන් කිරීමයි |
| 2. බුදු රදුන්ගේ මංගල ධර්ම දේශනාව වූයේ | b. මිතුරු බව |
| 3. තුන් බෑ ජටිලයන් රහත් වූයේ | c. දම්සක් පැවතුම් සූත්‍රය |
| 4. ''චරං'' යනුවෙන් හැඳින්වූයේ | d. ආදිත්ත පරියාය සූත්‍රය |
| 5. මෛත්‍රී කිරීම යන්නෙහි අදහසය. | e. ප්‍රඥාවන්ත වීමය. |

(03) පහත සඳහන් වාක්‍ය නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණද වරහන් තුළ යොදන්න.

1) වේළුවනාරාමය පූජා කළේ බිම්බිසාර රජතුමාය. (...........)
2) බුදුරදුන් ප්‍රථමවරට ලංකාවට වැඩම කරනු ලැබුවේ මැදින් පෝයදාය. (...........)
3) සේනාසන සිවුපසයට අයත් නොවේ. (...........)
4) ඉතිපිසෝ පාඨයෙහි බුදුගුණ 6 ක් කියවේ. (...........)
5) මහාසාල නම් මහලු පියාට පිහිට වීම අසරණ සරණ වීමකි. (...........)

(04) දෙන ලද පිළිතුරු වඩාත් සුදුසු පරිදි යොදා හිස්තැන් පුරවන්න.

(මහාවග්ග පාලි / ධර්මය / දහයක් / ඇම්.ඇල්. සිල්වා ගුරු මුහන්දිරම් තුමා / ප්‍රථම සංඝ සම්මේලනයට / තොටගමුවේ ශ්‍රී රාහුල හිමි)

1) බුද්ධත්වයෙන් පස්වන සතිය තුළදී බුදුන් වහන්සේ විසින් ........................................................ ගුරු තනතුරෙහි තබන සේක.
2) ........................................................ රහතන් වහන්සේලා එක්දහස් දෙසිය පනස් නමක් සහභාගී වූහ.
3) ''යො භික්ඛවේ මං උපට්ඨහෙය්‍ය'' යන ගාථාව ........................................................ යෙහි ඇතුළත් වූවකි.
4) බුදුගුණ අලංකාරයෙහි බුදුගුණ ........................................................ දක්වා ඇත.
5) ''කාව්‍යශේඛරය'' රචනා කරන ලද්දේ ........................................................ විසින්ය.

(05) පහත ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.

| | | | | |
|---|---|---|---|---|
| 1 ම | | | තා | |
| | | | | 2 |
| ඝඩි | | | | තා |
| | | 2 | සා | |
| | | | | |
| 3 | මි | | | සී |

<u>හරහට</u>

1) විශාල ශරීර ඇති සත්ත්වයෝ

2) දික් වූ ශරීර ඇති සත්ත්වයෝ

3) උපතක් සොයන සත්ත්වයෝ

<u>පහළට</u>

1) මධ්‍යම ප්‍රමාණයේ ශරීර ඇති සත්ත්වයෝ

2) උපන් සත්ත්වයෝ

## <u>II කොටස</u>

❖ පළමු ප්‍රශ්නයට සහ තෝරාගත් තවත් ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න.
**(සම්පූර්ණ ප්‍රශ්න සංඛ්‍යාව 05 කි.)**

(01) (i) ඔබ කණ්ඩායම් ක්‍රියාව සිදු කළේ කුමන මාතෘකාවක් යටතේ කරුණු රැස් කරමින්ද? (ල. 02)

(ii) එසේ කරුණු එක්රැස් කරමින් ඔබගේ කණ්ඩායම පන්තියට ඉදිරිපත් කළ නිර්මාණය පොදුවේ හැඳින්වෙන්නේ කුමන නමකින්ද? (ල. 02)

(iii) එම නිර්මාණය සිදු කිරීමේදී ඔබගේ කණ්ඩායම් නායකත්වය ක්‍රියා කළ ආකාර 02 ක් සඳහන් කරන්න. (ල. 02)

(iv) එම නිර්මාණය තුළින් ඔබ ලද අත්දැකීම් 04 ක් ලියන්න. (ල. 04)

(v) එම නිර්මාණය තවදුරටත් සාර්ථක කර ගැනීම සඳහා ඔබට කළ හැකිව තිබූ ක්‍රියා 02 ක් දක්වන්න. (ල. 02)

(02) (i) ලෝකයාට අනුකම්පාවෙන් දහම් දේශනා කරන ලෙස බුදුන් වහන්සේට ප්‍රථම ආරාධනාව සිදු කළේ කවුරුන් විසින්ද?

(ii) බුදුන් වහන්සේගේ ප්‍රථම කිඹුල්වත් නුවර ගමනට වැඩම කිරීම සඳහා එක් වූ රහතන් වහන්සේලා සංඛ්‍යාත්මකව දෙපිරිසක් ලෙස දක්වන්න.

(iii) බුද්ධත්වයේ සිට ප්‍රථම කිඹුල්වත් නුවර ගමන දක්වා වූ සිදුවීම් තුළින් ඔබගේ ජීවිතයට ලද ආදර්ශ 05 ක් ගොනු කරන්න.

(03) (i) බුදුන් වහන්සේ ගිලානෝපස්ථානය ආදර්ශයෙන්ම පෙන්නුම් කළ අවස්ථා 03 ක් නම් කරන්න.

(ii) උපස්ථායකයකු තුළ තිබිය යුතු අත්‍යවශ්‍යම ගුණාංග 04 ක් දක්වන්න.

(iii) එම ගුණාංග ඔස්සේ ඔබට උපස්ථායකයකු ලෙස කළ හැකි ක්‍රියා 05 ක් ඉදිරිපත් කරන්න.

(04) (i) ''සිරිත්'' යන්නෙහි අර්ථය පිළිබඳ නිර්වචනයක් දෙන්න.

(ii) වැසිකිළි භාවිතයේදී ඔබ විසින් ඉටු කළ යුතු සිරිත් 04 ක් දක්වන්න.

(iii) සිරිත් විරිත් නිසි පරිදි අනුගමනය කිරීම තුළින් ඔබගේ ජීවිතයට ලද හැකි ප්‍රයෝජන 05 ක් සඳහන් කරන්න.

(05) (i) භාවනාවක් සඳහා වැඩිය හැකි ''අනුස්සති භාවනාවන්'' 03 ක් ඉදිරිපත් කරන්න.

(ii) මෛත්‍රී භාවනාව වැඩිය හැකි ආකාර මොනවාද?

(iii) කරණීය මෙත්ත සූත්‍රයට අනුව මෙත් වඩන්නකු තුළ තිබිය යුතු බවට මුලින්ම සඳහන්ව ඇති ගුණාංග 05 ඉදිරිපත් කරන්න.

(06) (i) ''මාතා යථා නියං පුත්තං'' යන කොටසෙහි ඉතිරි පේළි 03 සම්පූර්ණ කරන්න.

(ii) ඒ තුළින් ප්‍රකාශ වන වඩාත්ම වැදගත් ගුණාංගය, කෙබඳු ආකාරයක් ගනීදැයි සරලව දක්වන්න.

(iii) මෛත්‍රී භාවනාව වඩන්නකුට ලද හැකි ආනිශංස ලෙස බුදුන් වහන්සේ විසින් දේශිත ආනිශංස අතුරින් 05 ක් සඳහන් කරන්න.

(07) (i) සුදත්ත සිටුතුමා හා විශාඛාවෝ බුද්ධ ප්‍රමුඛ මහා සංඝ රත්නය උදෙසා පූජා කරන ලද ආරාම 02 ක් අනුපිළිවෙළින් නම් කරන්න.

(ii) සුදත්ත සිටුතුමා සහ විශාඛාව ලද අන්වර්ථ නාමයන් පිළිවෙළින් ඉදිරිපත් කරන්න.

(iii) විශාඛා සිටුදියණියගේ චරිතයෙන් ඔබගේ ජීවිතයට ලද හැකි ආදර්ශ 05 ක් ගොනු කරන්න.